# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2016

**සමුපකාර සේවක කොමිෂන් සභාව**

අංක 100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

කොළඹ 02

## දර්ශනය

තෘප්තිමත්

සමුපකාරික මානව සම්පතක් නිර්මාණය

කිරීම

# මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා
එම ක්ෂේත්‍රයේ
මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස
අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම

## කාර්යයන්

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී, උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

- සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියාමාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි තීරණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## සමුපකාර සේවක කොමිෂන් සභාව - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2016

සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතතාව සහ ශුභ සිද්ධිය උදෙසා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියලු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම මෙම වාර්තාව මගින් සිදු කර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පරිච්ඡේද වලින් සමන්විත වන පරිදි මෙම වාර්තාවෙහි අන්තර්ගතය සකස් කර ඇත.

- **පළමු පරිච්ඡේදය**

  **සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා 2016 වර්ෂය තුළ සේවා නියුක්තිය පිළිබඳ කරුණු**

- **දෙවන පරිච්ඡේදය**

  කොමිෂන් සභාවේ විෂය පථයට අයත්, මුදුන් මට්ටමේ සමුපකාර සමිතිවල නාම ලේඛනය හා 2016 වර්ෂය තුළ එම සමිතිවල සේවයේ යෙදී සිටි සේවකයින් පිළිබඳ කරුණු

- **තුන්වන පරිච්ඡේදය**

  කොමිෂන් සභා කාර්යාලයේ භෞතික හා මූල්‍ය කටයුතු සහ 2016 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද සමස්ත කාර්යයන් සමාලෝචනය කිරීම

# පටුන


1. පරිච්ඡේදය

- කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු හා සංවිධාන ව්‍යුහය 02-03
- 2016 වර්ෂයේ සේවා නියුක්තිය 04

11. පරිච්ඡේදය

- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිතිවල
  2016 වර්ෂයේ සේවා නියුක්තිය 06-08

111. පරිච්ඡේදය

- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය 10-13
- 2016 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය 14-16
- 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති 17

## 1 පරිච්ඡේදය

- **කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු හා සංවිධාන ව්‍යුහය**
- **2016 වර්ෂයේ සේවා නියුක්තිය**

## සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා පාලන කටයුතු

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයින් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 3ක කාල සීමාවක් එකී ධූරයන් දැරිය යුතු වේ. එසේ වුවද සාමාජිකයකුගේ ඉල්ලා අස්වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වලදී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයෙකු පත් කිරීමට ඇමතිවරයාට හැකිවේ.

2016 වර්ෂයේදී මෙම කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස ආර්.එම්.සී.ජී.උඩුගම්පොල මහත්මිය කටයුතු කල අතර, සෙසු සාමාජිකයින් ලෙස නීතිඥ අයි.එම්.ජී. ඊරියගොල්ල මහතා සහ නීතිඥ බන්දුල විජේසිංහ මහතා කටයුතු කරන ලදී.

1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු පත් කල යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.

2016 වර්ෂයේ කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්වරිය ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක වන කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පවිත්‍රා ජයතිස්ස මහත්මිය කටයුතු කරන ලදී.

1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු නිලධාරීන් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2016 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

# සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය



## 2016 වර්ෂයේ සේවා නියුක්තිය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2016.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 (වැ.බ.) | - |
| ගණකාධිකාරී | 01 | 01 | - |
| නීති නිලධාරී | 01 | - | 01 |
| පරිපාලන නිලධාරී (රාජ්‍ය කළමනාකරණ සහකාර - අධි ශ්‍රේණිය) | 01 | (අභ්‍යන්තර නිලධාරියෙක් රාජකාරී ආවරණය කරනු ලබයි) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (1/11/111) | 08 | 07 | 01 |
| සංවර්ධන නිලධාරී | 05 | 02 | 03 |
| රියදුරු | 03 | 03 | - |
| කාර්යාල කාර්ය සහයක | 03 | 02 | 01 |
| එකතුව | **23** | **16** | **07** |

## ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

| නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| කේ.ඩබ්.ඩබ්.ජී. කුමාරසිංහ මයා | රා.ක.ස. | - | 2016.01.13 |
| එස්. ඉලංකෝන් මයා | රා.ක.ස. | 2016.01.14 | - |
| කේ.ජී.ඩී. විජේවර්ධන මයා | රියදුරු | - | 2016.04.11 |

## 11 පරිච්ඡේදය

- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා
  එම සමිති වල 2016 වර්ෂයේ සේවා නියුක්තිය

## ජාතික මට්ටමේ සමුපකාර සංගම් / දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අධීක්ෂණයට යටත්වන ජාතික මට්ටමේ සමුපකාර සංගම්/ දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති සේවකයින්ගේ සේවාවන්ට අදාළ වන කරුණු පිළිබඳව නියාමනය කිරීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇත. සමුපකාර සේවකයින්ගේ සේවා ප්‍රශ්න විසඳීම පමණක් නොව තනතුරු සඳහා සුදුසුකම් තීරණය කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම වැනි කටයුතු ද මෙම කොමිෂන් සභාව මගින් ඉටුකරනු ලැබේ. එසේම අවශ්‍ය අවස්ථාවන්හිදී පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවලට යම් යම් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබා දීමද ජාතික වශයෙන් පොදු එකඟතාවයකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය මග පෙන්වීම් සිදු කිරීමද මෙම කොමිෂන් සභාව මගින් ඉටු කරනු ලැබේ. පහත සඳහන් සමුපකාර සමිතිවල සේවකයින්ගේ සේවා සම්බන්ධ සියලුම කටයුතු මෙම කොමිෂන් සභාව මගින් නියාමනය කරනු ලැබේ.

### ජාතික මට්ටමේ සමුපකාර සංගම් / දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති වල 2016 වර්ෂයේ සේවා නියුක්තිය

| | සමිතියේ නම | සේවකයින් ගණන |
|---|---|---|
| | **සමුපකාර සංගම්** | |
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 36 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය | 18 |
| 03 | සී/ස ශ්‍රී ලංකා පේෂකර්ම සමුපකාර සමිති සංගමය | 05 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 111 |
| 05 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 03 |
| 06 | සී/ස ශ්‍රී ලංකා තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 01 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය | 20 |
| 08 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 162 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 31 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 41 |
| 11 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | 09 |
| 12 | සී/ස ශ්‍රී ලංකා සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 03 |

| | දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති | සේවකයින් ගණන |
|---|---|---|
| 13 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 777 |
| 14 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 76 |
| 15 | සී/ස දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සමුපකාර ණය දෙන සමිතිය | 04 |
| 16 | සී/ස තැපැල් හා විදුලි සංදේශ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 34 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 18 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 24 |
| 19 | සී/ස රජරට විශ්ව විද්‍යාලීය සමුපකාර සමිතිය | 06 |
| 20 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | 07 |
| 21 | සී/ස ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 09 |
| 22 | සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 23 | සී/ස සමෘද්ධි සංවර්ධන, කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 24 | සී/ස රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සමුපකාර ණය දෙන සමිතිය | 06 |
| 25 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරීන්ගේ ස.ණ.ස. | 11 |
| 26 | සී/ස දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 27 | සී/ස වරාය අධිකාරිය සේවක සමුපකාර බැංකුව | 18 |
| 28 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 34 |
| 29 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීම් සමුපකාර ණය දෙන සමිතිය | 23 |
| 30 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 31 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 32 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 42 |
| 33 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර ණය දෙන සමිතිය | 10 |
| 34 | සී/ස කොළඹ මහාරෝග්‍යශාලීය සේවක ස.ණ.ස. | 10 |

| | | |
|---|---|---|
| 35 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 06 |
| 36 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 37 |
| 37 | සී/ස ස.තො.ස. සේවක සමුපකාර ණය දෙන සමිතිය | 09 |
| 38 | සී.ස. වරාය අධිකාරියේ සේවක සුභසාධක ස.ණ.ස. | 19 |
| 39 | සී/ස ශ්‍රී ලාංකික මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර සමිතිය | 07 |
| 40 | සී/ස වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | 02 |
| 41 | සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 07 |
| 42 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | 01 |
| 43 | සී/ස ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | 08 |
| 44 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 07 |
| 45 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | 14 |
| 46 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | 12 |

.

## 111 පරිච්ඡේදය

- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය

- 2016 වර්ෂයේ මූල්‍ය කාර්යඵල සාධනය

# 2016 වර්ෂයේ කරන ලද කාර්යය සමාලෝචනය

සමුපකාර සේවකයන්ට හා සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට කොමිෂන් සභාවේ කාර්යභාරය, කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳව සහ කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව සමුපකාර සේවකයින්ට හිමිවන අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2016 වර්ෂය තුළ වැඩමුළු 10ක් පැවැත්වීමට සැලසුම් කළ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට එවැනි වැඩමුළු 13ක් පවත්වා ඇත.

## 2016 වර්ෂයේ පැවැත් වූ වැඩමුළු










**සමුපකාර සේවක වැඩමුළු හා කාර්යය මණ්ඩල වැඩමුළු - 2016**

**සමුපකාර සේවකයින් හා කාර්යය මණ්ඩලය සඳහා පැවැත් වූ වැඩමුළු**

| | ආයතනය | පැවැත්වූ වැඩමුළුව | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01. | නිපුණතා සංවර්ධන අරමුදල | කොමිෂන් සභා නිලධාරීන් පුහුණු වැඩමුළුව (පෞද්ගලික ලිපි ගොනු) | 02 |
| 02. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය- සබරගමුව පළාත | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 85 |
| 03. | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය<br>සී/ස ලංගම සේවක සමුපකාර සමිතිය<br>සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය<br>සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය<br>සී/ස ජාතික තරුණ සේවා සමුපකාර සමිතිය<br>සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය<br>සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය<br>සී/ස කොළඹ මහාරෝගාශාලීය ඉතිරි කිරීමේ හා ණය දීමේ සමුපකාර සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 20 |
| 04. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 30 |
| 05. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 40 |
| 06. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය- බස්නාහිර පළාත | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 90 |
| 07. | නිපුණතා සංවර්ධන අරමුදල | කොමිෂන් සභා කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව (රියදුරු) | 03 |
| 08. | ශ්‍රී ලංකා කාන්තා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 65 |

| | | | |
|---|---|---|---|
| 09. | නිපුණතා සංවර්ධන අරමුදල | කොමිෂන් සභා කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව | 30 |
| 10. | සියලුම සමුපකාර සමිති සඳහා | විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ වැඩමුළුව | 55 |
| 11. | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම | 30 |
| 12. | සියලුම සමුපකාර සමිති සඳහා | අංක 2016/01 නව වැටුප් චක්‍රලේඛය එළි දැක්වීමේ වැඩමුළුව | 150 |
| 13. | සියලුම සමුපකාර සමිති සඳහා | අංක 2016/01 නව වැටුප් චක්‍රලේඛය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 80 |

සමුපකාර සේවකයන්ට අදාළ නීතිමය කටයුතු වලදී අධිකරණයට සහාය වීමත් කොමිෂන් සභාව වගඋත්තරකරු ලෙස නම් කර ඇති නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වීමත් මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයකි. 2016 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු 16ක් සඳහා කොමිෂන් සභාව වෙනුවෙන් නිලධාරීන් පෙනී සිට ඇත.

| නඩු අංකය | පැමිණිල්ල | විත්තිය | 2016.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|
| 3267,3275, 3276,3277, 3278,3279, 3280,3281, 3284 | සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.(කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි) | මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ. |
| 3265,3266,3269,3270, 3271,3273, 3274 | සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.(කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි) | කොමිෂන් සභා තීරණය බල ගන්වා තීන්දුව දී ඇත.ඊට එරෙහිව සමිතිය විසින් අභියාචනා කර ඇත. |

## 2016 වර්ෂය තුළ තනතුරු සඳහා අනුමත කිරීම

| | සමුපකාර සමිතියේ නම | තනතුර | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සනීපාරක්ෂක කම්කරු | 01 |
| 02 | ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සාමාන්‍යාධිකාරී | 01 |
| 03 | මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | වෙළඳසැල් කළමනාකරු | 01 |
| 04 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | සහකාර සාමාන්‍යාධිකාරී | 01 |
| 05 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 01 |
| 06 | තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | කළමනාකරණ සහකාර | 01 |
| 07 | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 02 |
| 08 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 02 |
| 09 | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සහකාර අභ්‍යන්තර විගණක | 01 |
| 10 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | ගණකාධිකාරී | 01 |
| 11 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක සමුපකාර සමිතිය | ගණකාධිකාරී | 01 |
| 12 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 01 |
| 13 | සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | ගණකාධිකාරී | 01 |
| 14 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | කළමනාකරණ සහකාර | 01 |
| | | වෙළඳ සහයක | 04 |
| | | කම්කරු | 05 |
| 15 | මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සාමාන්‍යාධිකාරී | 01 |
| | එකතුව | | 26 |

- **ඉහත කාර්යයන්ට අමතරව 2016 වර්ෂයේ කොමිෂන් සභාව විසින් ඉටුකළ විශේෂ කාර්යයන්**

1.) සමුපකාර සේවකයින් සඳහා 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද අංක 2007/5 දරණ වැටුප් චක්‍ර ලේඛනය වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංශෝධනය කර ජාතික මට්ටමේ සමුපකාර සංගම් / දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති සඳහා අනුමත තනතුරු, වැටුප් පරිමාණ සහ සුදුසුකම් ලෙස නම් කර 2016.12.20 දින එළි දක්වන ලදී.

## 2016 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය

**ඉහත කාර්යයන් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන හා ඒ සඳහා 2016 වර්ෂයේදී දරන ලද වියදම්**

| | ක්‍රියාකාරකම | අයවැය ඇස්තමේන්තුව (රු.) | 2016.12.31 දිනට වියදම(රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| 01. | සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා | 850,000.00 | 771,900.00 | 78,100.00 |




| | **2015** (රු.) | **2016** (රු.) |
|---|---|---|
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 618,385.05 | 771,900.00 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 367,998.00 | - |




| | 2015 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| වැටුප් | 7,041,525.78 | 7,531,514.29 |
| ගමන් වියදම් | 42,935.50 | 34,902.50 |
| සැපයීම් සේවා | 640,660.41 | 761,028.42 |
| නඩත්තු වියදම් | 884,019.11 | 1,088,327.27 |
| ගිවිසුම්ගත සේවා | 4,627,038.07 | 3,725,681.54 |
| මාරු කිරීම් | 36,345.24 | 20,537.20 |




| | 2015 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| 1 වන කාර්තුව | 2,180,644.63 | 2,797,245.11 |
| 2 වන කාර්තුව | 3,264,344.89 | 3,357,591.74 |
| 3 වන කාර්තුව | 3,235,106.17 | 3,403,966.36 |
| 4 වන කාර්තුව | 5,809,554.23 | 4,375,088.01 |

## 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත.

| | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාල සීමාව | ඇස්තමේන්තු මුදල | අරමුදල් ප්‍රභවය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | සමුපකාර ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීමේ වැඩසටහන් | 2017 ජනවාරි-දෙසැම්බර් | රු.750,000.00 | අයවැය ප්‍රතිපාදන | සමුපකාර ව්‍යාපාරය හා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම |
| 02. | කොමිෂන් සභා කාර්යය මණ්ඩලය පුහුණු කිරීම | 2017 ජනවාරි-දෙසැම්බර් | රු.150,000.00 | අයවැය ප්‍රතිපාදන | කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම |